තේ තතු

පර්යේෂණ කර්මාන්තයේ 75 වසරක අභිමානය
75 வருட ஆய்வின் சாதனை
75 Years of Research Achievement

THE TEA RESEARCH INSTITUTE OF SRI LANKA
SALUS UNITAS NOSTRA
INCORPORATED 1925

ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ ප්‍රකාශනයකි
ISSN - 1391-6785
දෙවන කාණ්ඩය, දෙවන කලාපය 2002 ජූලි - දෙසැම්බර්

# වාණිජ රිකිලි තවාන් නිරීක්ෂණයේ අත්දැකීම් කිහිපයක්

වාණිජ රිකිලි තේ තවාන් පවත්වාගෙන යෑම සඳහා තවාන්කරුවන්ට කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මගින් ලියාපදිංචි කරනු ලබයි. උසස් තත්වයේ නිරෝගී තේ පැලයක් නිපදවා අලෙවි කිරීම සඳහා මෙසේ ලියාපදිංචි කරගනු ලැබූ තවාන් කරුවන් යොමු කරනු ලබයි. අපේ භූමියේ සිටුවනු ලබන සෑම තේ පැලයක්ම උසස් ඵලදායිත්වයකින් යුතු නිරෝගී තේ පැලයක් වනු දැක්ම මෙහි මූලික අරමුණයි. එම අරමුණ කරා ලභාවීම සඳහා කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය හා තේ පර්යේෂණායතන විසින් මෙම ලියාපදිංචි තේ තවාන්, තවාන් කාල සීමාවේ දී අදියර කිහිපයක් තුලදී ඇගයීමට ලක් කෙරේ.

අවසාන ඇගයීම කරනු ලබන තේ පර්යේෂණායතනය විසින් යම් ප්‍රමිතියකට ඇති පැල පමණක් විකිණීම සඳහා අනුමැතිය ලබාදේ. මෙහිදී සලකා බලනු ලබන විවිධ පරාමිතීන් අතර තවාන් මල්ලේ අවම උස අඟල් 7 සහ පළල අඟල් 5 වීම, මුල්වල වර්ධනය සතුටුදායක වීම, අඩියක් පමණ සීමාවේ පත්‍ර 20 - 25 තිබීම සහ අවම වශයෙන් අතු 3 වර්ධනය වී තිබීම යන කරුණු ඉතා වැදගත් තැනක් ගනී.

තත්වය එසේ වුවත් අප විසින් පසු ගිය වසර 2-3 මුලුල්ලේ සිදුකර ඇති අවසන් පරීක්ෂණ වලින් පෙනී යන්නේ තවාන් කරුවන් බොහෝ දෙනෙකු ඉහත කරුණු කෙරෙහි දක්වන සැලකිල්ල ඉතා අඩු බවය. එසේ නොමැති නම් ඒ පිළිබඳ දැනුවත් භාවයක් නොමැති බවය. පහත වගුවේ දැක්වෙන රත්නපුර දිස්ත්‍රික්කය තුල එසේ සිදු කල තවාන් පරීක්ෂණ වල දල ප්‍රතිඵල කිහිපයකින් එය වඩාත් තහවුරු වේ.

| වසර | පරීක්ෂා කල තවාන් සංඛ්‍යාව. | යෙදූ රිකිලි වලින් අවසන් පරීක්ෂණය කරන විට තිබූ පැල වල සාමාන්‍ය % | තිබූ පැල වලින් යෝග්‍ය පැල වල සාමාන්‍ය % |
|---|---|---|---|
| 2000 | 24 | 15% | 6% |
| 2001 | 13 | 20% | 21% |
| 2002 | 19 | 24% | 59% |

මෙම තොරතුරු පිළිබඳ තවදුරටත් විමසා බැලීමේදී පෙනී ගිය ප්‍රධාන කරුණක් වූයේ තවාන් කරුවන් තමන් ගේ පැළවලින් වැඩි ප්‍රමාණයක් අවසන් පරීක්ෂණයට ලක් නොකර අලෙවි කර ඇති බවය. මෙය කිසිසේත්ම නිවැරදි ක්‍රියාමාර්ගයක් නොවන්නේ තවාත් පරීක්ෂණයේ මුඛ්‍යාර්ථයන් ද මෙතුලින් බිඳ වැටෙන හෙයිනි.

පැහැදිලි වන අනෙක් කරුණ නම් නිපදවන පැළවලින් බොහෝමයක් නියමිත ප්‍රමිතීනට අනුකූල නොවන බවයි. එසේ සුදුසු නොවීමට හේතුවූ ප්‍රධාන කරුණු නම් ; මුල් වර්ධනය අසතුටුදායක වීම, තවාන් මල්ලේ උස ප්‍රමාණවත් නොවීම, අතු නොබෙදී තනි කෙලින් වැඩුනු කඳන් පමණක් තිබීම, පත්‍ර සංඛ්‍යාව 6-7 ටත් වඩා අඩුවීම යනාදිය වේ.

මෙ සම්බන්ධයෙන් තවාන් කරුවන්ගෙන් විමසීමේදී ඔවුන් පවසන්නේ පැළවලට ඇති අධික ඉල්ලුමත්, එකවර විශාල මුදලක් වැයකිරීමට වගාකරුවන්ට ඇති නොහැකියාව /නොකැමැත්ත නිසාත් ප්‍රමිතියෙන් අඩු පැළ මිලදී ගැනීමට වගාකරුවන් පෙළඹී සිටින බවයි. අලෙවි කිරීම සඳහා ප්‍රමිතියකට අනුකූල තේ පැලයක් නිපදවීම සඳහා මෙම තත්වය බාධාවක් වන බව ඔවුහු පෙන්වා දෙති. එබැවින් ඉතා උසස් තත්වයේ පැලයක් සිටුවීම සඳහා කිසියම් උනන්දුවක් හෝ පෙළඹවීමක් වගාකරුවන් තුල ඇති කිරීමේ ජාතික වැඩ පිළිවෙලක අවශ්‍යතාවය ඉතාමත් ප්‍රබලව මතුවේ.

කෙසේ වෙතත් ඇතැම් ලියාපදිංචි තවාන්වල බොහෝ මූලික අඩුපාඩු ද පවතී. ඇතැම් තවාන්වල පැල මියයාමේ ප්‍රතිශතය ද ඉතා ඉහළය. මෙයට මූලික හේතුව වන්නේ තවාන සඳහා සුදුසු පස් තෝරා නොගැනීමත්, තවානේ හොඳින් ජලය බැස යෑම සඳහා සුදුසු විධිවිධාන නොයෙදීමත් ය.

එබැවින් සාර්ථක තවානක් පවත්වාගෙන හොඳ තේ පැළයක් අපේ පොළවේ සිටුවීමට තවාන්කරුවන් ද අදිටන් කරගැනීම ඉතාමත් වැදගත්ය.

ජානක මහින්දපාල